සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 1 2 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I
Communication & Media Studies - I

29 S I

පැය දෙකයි
Two hours

විභාග අංකය : ..................................................................

**සැලකිය යුතුයි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (5) යොදන්න.**

01. දෙවන ලෝක යුධ සමයේ විවිධ සන්නිවේදන ක්‍රම භාවිත කර ඇත. එහි අවම වශයෙන් දක්නට ලැබුණේ,
(1) අන්තර්ජාල භාවිතය
(2) පරවියන් භාවිතය
(3) කොඩි භාවිතය
(4) ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය
(5) වර්ණ භාවිතය

02. සන්නිවේදන අධ්‍යයනය ස්වාධීන විෂයක් ලෙස වර්ධනය වීමට බලපෑ සාධක අතර **සාවද්‍ය ප්‍රකාශය** වන්නේ,
(1) සන්නිවේදන තාක්‍ෂණයේ දියුණුව
(2) ජනමාධ්‍යයන්ගේ වර්ධනය
(3) මාධ්‍යයේ බලපෑම
(4) මුදල් හුවමාරුව සංකීර්ණ වීම.
(5) විශ්වවිද්‍යාල ක්‍රියාකාරිත්වය

03. 20 වන සියවසේ මුල් භාගයේ දී සන්නිවේදන විෂය ශාස්ත්‍රීය විෂයයක් ලෙස දියුණුවීමට බලපෑ වඩාත් වැදගත් සාධකය වන්නේ,
(1) සාක්ෂරතාවය වර්ධනය වීම.
(2) විශ්වවිද්‍යාලවල පර්යේෂණ ආරම්භ වීම.
(3) ජනමාධ්‍ය වර්ධනය හා ව්‍යාප්තිය
(4) කාර්මික විප්ලවය
(5) වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය සංකීර්ණ වීම.

04. රූපවාහිනියේ ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නැරඹීම නිසා ළමා මනස විකෘති වන බව පර්යේෂණාත්මකව මුල්වරට පෙන්වා දෙන ලද්දේ,
(1) ඉලිනොයිස් විශ්වවිද්‍යාලය යි.
(2) නෙදර්ලන්ත යුට්‍රෙක්ට් විශ්වවිද්‍යාලය යි.
(3) හොනලුලු විශ්වවිද්‍යාලය යි.
(4) ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය යි.
(5) පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාලයයි.

05. ජනමාධ්‍යයේ න්‍යාය සහ ව්‍යවහාරය යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) විඥාපනය හා බලපෑමයි.
(2) මාධ්‍ය සාක්ෂරතාව හා විචාරයයි.
(3) සංජානනය හා දෘෂ්ටිවාදයයි.
(4) දේශපාලනය හා සංස්කෘතියයි.
(5) සාක්ෂරතාව හා සංස්කෘතියයි.

06. සන්නිවේදන ක්ෂේත්‍රයට චාල්ස් කූලීන්ගෙන් සිදුවූ මෙහෙවර අතර වඩාත් වැදගත් වන්නේ,
(1) මනෝ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් සන්නිවේදනය විග්‍රහ කිරීම.
(2) දේශපාලන දෘෂ්ටි කෝණයෙන් සන්නිවේදනය විග්‍රහ කිරීම.
(3) සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් සන්නිවේදනය විග්‍රහ කිරීම.
(4) ආර්ථික දෘෂ්ටි කෝණයෙන් සන්නිවේදනය විග්‍රහ කිරීම.
(5) සංස්කෘතික දෘෂ්ටි කෝණයෙන් සන්නිවේදනය විග්‍රහ කිරීම.

07. සිනමාව හා සම්බන්ධ වැදගත් පුද්ගලයින් දෙදෙනෙකු වන්නේ,
(1) ලැස්වෙල් හා කර්ට් ලොවින් (2) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් හා මාකෝනි
(3) ක්ලෝඩ් ෂැනන් හා වොරන් වීවර් (4) ලුයි ලුමියර් හා ඔගස්තෙ ලුමියර්
(5) ජෝන් ඩුවී හා ජෝර්ජ් ගාබ්නර්

08. මහජන සන්නිවේදනය සම්බන්ධයෙන් පිළිගත හැකි වගන්තිය තෝරන්න.
(1) සන්නිවේදකයා දෘශ්‍යමාන වේ. ඔහුගේ හඬ ශ්‍රවණය වේ. ග්‍රාහකයාට වඩාත් සමීප වේ.
(2) සන්නිවේදන තාක්ෂණික උපකරණ රහිතව බොහෝ දුරට මහජන සන්නිවේදනය කළ හැකි වේ.
(3) මහජන සන්නිවේදනය මඟින් ජනයා පොළඹවා ගැනීම පමණක් කළ හැකිවේ.
(4) මහජන සන්නිවේදනය සාර්ථක වීමට නම් රැස්වීම් භූමියේ ග්‍රාහකයා සිටින දුර පරාසය සෘජුවම බලපානු ඇත.
(5) මහජන සන්නිවේදනය සාර්ථක/ අසාර්ථක වීමට රැස්ව සිටින ග්‍රාහක සංඛ්‍යාව බල නොපානු ඇත.

09. ආකේතීකරය යනු පණිවිඩය,
(1) සම්ප්‍රේෂණය කරන්නා ය. (2) ප්‍රතිග්‍රහණය කරන්නා ය.
(3) අර්ථකථනය කරන්නා ය. (4) නිශේධනය කරන්නා ය.
(5) අනුමත කරන්නා ය.

10. ''සන්නිවේදනයේ දී සන්නිවේදක අපේක්ෂා කළ ප්‍රතිඵලය සාක්ෂාත් කරගැනීම වැදගත් ය.'' මෙම ප්‍රකාශය හා සම්බන්ධ නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
(1) විල්බර් ශ්‍රාම් (2) චාල්ස් කූලී
(3) ෂැනොන් වීවර් (4) හැරල්ඩ් ලැස්වෙල්
(5) ජෝන් ඩුවී

11. ජනමාධ්‍ය මඟින් කිසියම් සංසිද්ධියක් පිළිබඳ විෂය මූලික මෙන්ම විශ්ලේෂණාත්මක විග්‍රහයක් ලබාදීම සම්බන්ධයෙන් තීරණාත්මක සාධකය වන්නේ,
(1) සංජානනය යි. (2) දොරටුපාලනය යි.
(3) හිමිකාරිත්වය යි. (4) වාර්තාකරණය යි.
(5) සංස්කරණය යි.

12. නීතිය හා සාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජ මාධ්‍ය වාරණය කරනු ලබන්නේ ඒවා,
(1) නිල මූලාශ්‍ර මත පමණක් තොරතුරු ඉදිරිපත් කරන බැවිනි.
(2) ඉහළ විශ්වසනීයත්වයක් පවතින බැවිනි.
(3) සමාජ සහජීවනයට බාධා ඇති නොවන බැවිනි.
(4) විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කරන බැවිනි.
(5) ඉතා වේගයෙන් ග්‍රාහකයින් අතර පැතිරයන බැවිනි.

13. රාජ්‍ය හිමිකම සහ පෞද්ගලික හිමිකම සහිත මාධ්‍ය අන්තර්ගත වරණය වන්නේ,
(1) සිරස TV සහ ලංකාදීප ය. (2) දිවයින සහ දෙරණ ය.
(3) ස්වාධීන සේවය හා හිරු FM ය. (4) ලේක්හවුස් හා ජාතික රූපවාහිනිය ය.
(5) මව්බිම හා නෙත් FM ය.

14. සන්නිවේදන විෂය පෝෂණය කිරීමට සමාජ විද්‍යා, දේශපාලන විද්‍යා, අධ්‍යාපන විද්‍යා ක්ෂේත්‍ර නියෝජනය කළ මහා පුරුෂයින් වන්නේ,
(1) චාල්ස් කූලී, කර්ට් ලෙවින්, පොල් ලැසාස් ෆෙල්ඩ්
(2) චාල්ස් කූලී, වෝල්ටර් ලිප්මාන්, ජෝන් ඩුවී
(3) හැරල්ඩ් ලැස්වෙල්, විල්බර් ශ්‍රාම්, කාල් හවුලන්
(4) ජෝන් ඩුවී, විල්බර් ශ්‍රාම්, ක්ලෝඩ් ෂැනොන්
(5) චාල්ස් කූලී, කර්ට්ලෙවින්, කාල් හවුලන්

15. සාම්ප්‍රදායික මාධ්‍ය සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) කාලය හා දුර සම්බන්ධ හුවමාරුවක් හැමවිටම දැකිය හැකි මාධ්‍ය විශේෂයකි.
(2) නම්‍යශීලිත්වය උපරිමයෙන් දැකිය හැකි මාධ්‍ය විශේෂයකි.
(3) උපදේශනාත්මක සන්දේශ ජනනය කළ හැකි මාධ්‍යයකි.
(4) අහිතකර සමාජ ප්‍රවණතා බැහැර කරලීම පිණිස යොදාගත හැකි මාධ්‍ය විශේෂයකි.
(5) තේමාව හා අන්තර්ගතය අතර මනා සබැඳියාවක් ඇති මාධ්‍ය විශේෂයකි.

16. ක්‍රි. ව. 19331945 අතර කාලයේ ජර්මනියේ ඒකාධිපති පාලකයා ලෙස ප්‍රසිද්ධ වූයේ,
(1) ජෝසෆ් ගොබෙල්ස් ය. (2) බොනිටෝ මුසෝලිනී ය.
(3) ඒබ්‍රහම් ලින්කන් ය. (4) මුවමර් ගඩාෆි ය.
(5) ඇඩොල්ෆ් හිට්ලර් ය.

17. පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාල පර්යේෂණ කණ්ඩායම විසින් රූපවාහිනී ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නිසා ළමයින් තුළ සිදුවන ප්‍රධාන වෙනස්කම් තුනක් වන්නේ,
A වේදනාත්මක දේ පිළිබඳ දරුවන්ගේ සංවේදීතාව අඩුවීම.
B විචාරශීලී මාධ්‍ය කුසලතා වර්ධනය වීම.
C දරුවන් ඔවුන් ජීවත්වන ලෝකය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇතිකරගැනීම.
D ආක්‍රමණශීලී වීමට හා ඉක්මනින් ආරවුල් ඇති කරගැනීමට නැඹුරු වීම.
(1) BCD ය. (2) ACD ය. (3) ABC ය.
(4) ABD ය. (5) ABCD යන කිසිවක් නොවේ.

18. වෘත්තියාභිමුඛ පාඨමාලා හඳුන්වා දීමේ දී සන්නිවේදන විෂය විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දීමේ ප්‍රධාන සාධකය වූයේ,
(1) 1983 කළු ජූලිය යි. (2) 1988 89 තරුණ අරගලය යි.
(3) 1956 සමාජ පෙරළිය යි. (4) 1971 කැරැල්ල යි.
(5) අධ්‍යාපන ධවල පත්‍රිකාව යි.

19. මාධ්‍ය සංස්කෘතිය සම්බන්ධ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) මානව වර්ගයාගේ සංස්කෘතිය පරිණාමය නිසා උපන් සංස්කෘතික ප්‍රභේදයකි.
(2) විඥාපන සමාජයේ සංස්කෘතිය ලෙස ද අර්ථ දැක්විය හැක.
(3) ප්‍රතිනිෂ්පාදන තාක්‍ෂණ කලාව නිසා අතීත අංග අවප්‍රමාණය කරන සංස්කෘතියකි.
(4) මාධ්‍ය ක්ෂේත්‍රයෙහි පවතින ද්‍රව්‍යමය හා ආධ්‍යාත්මික වටිනාකම්වල සමස්ථය විදහා දක්වන සංස්කෘතිය යි.
(5) පෞද්ගලික සතුට විනෝදය ද්විතීක ස්ථානයට පත්කර ඇති සංස්කෘතියකි.

20. සන්නිවේදන විෂය ශ්‍රී ලංකාව තුළ ආරම්භය කිරීමට පුරෝගාමී වූ අධ්‍යාපන අමාත්‍යවරයා වූයේ,
(1) අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (2) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර
(3) රිචඩ් පතිරණ (4) ලලිත් ඇතුලත්මුදලි
(5) සරත් අමුණුගම

I

| | | | | | |
|---|---|---|---|---|---|
| A. | තොරතුරු මූලාශ්‍රය | E. | බලපෑම | I. | පෙරහණ |
| B. | බාධක | F. | ආකේතකරය/ සන්නිවේදක | J. | මාධ්‍ය |
| C. | ග්‍රාහකයා/ විකේතකරය | G. | අර්ථකථනය | | |
| D. | සන්දේශය | H. | අගස්ථය | | |

21. ඉහත දක්වා ඇති අක්ෂර අතුරින් ෂැනොන් වීවර් ආකෘතියට අයත් වන අංග තුනක් වන්නේ,
(1) E, A හා B ය. (2) B, C හා G ය.
(3) B, C හා D ය. (4) C, D හා E ය.
(5) E, F හා G ය.

22. HUB ආකෘතියට අදාළ අංග හතරක් වන්නේ,
(1) A, B, C හා G ය. (2) C, E, F හා I ය.
(3) B, C D හා E ය. (4) A, C, E හා G ය.
(5) C, D, F හා I ය.

23. හැරල්ඩ්ලැස්වෙල් ආකෘතියේ අංග අනුපිළිවෙළින් දක්වා ඇත්තේ,
(1) B, C, D, E සහ I ය. (2) A, B, C, D හා E ය.
(2) E, F, G, H සහ J ය. (4) F, D, J, C සහ E ය.
(5) A, B, G, H සහ E ය.

24. ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියේ වැදගත්ම අංගය වන්නේ,
(1) A ය. (2) F ය.
(3) B ය. (4) D ය.
(5) G ය.

25. සන්නිවේදනයේ කාර්යයන් පිළිබඳ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) පෙළඹවීම. (2) විනෝදාස්වාද සම්පාදනය
(3) සන්ධර්භයානු ගත වීම. (4) උපදෙස් සම්පාදනය
(5) තොරතුරු සම්පාදනය

26. පොදු ජීවන රටාවක් සඳහා අවශ්‍ය හර පද්ධතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය මෙහෙවරට අදාළ වන්නේ,
(1) සහානුභූතිය (2) සංකෘතික හුවමාරුව (3) සංජානනය
(4) සාක්ෂරතා ඥානය (5) සමාජානුයෝජනය

27. සාම්ප්‍රදායික මාධ්‍ය පරිසර හිතකාමී සරල සන්නිවේදන භාවිතයකි. එයට අදාළ කරගත නොහැකි වන්නේ,
(1) සරල ව්‍යුහය (2) තේමා අන්තර්ගතය
(3) සංවිධාන ගත ව්‍යුහය (4) නම්‍යශීලීත්වය
(5) සංස්කෘතික සන්ධර්භය

28. යුධ තොරතුරු ලබාදීමට භාවිත කළ මාධ්‍ය ජනයා වෙනුවෙන් භාවිත කරන ලෙස ප්‍රථමවරට ප්‍රකාශ කරන ලද්දේ,
(1) ජෝන් ඩුවී විසිනි. (2) චාල්ස් කූලි විසිනි.
(3) විල්බර්ශ්‍රාම් විසිනි. (4) ජෝන් රීත් ස්වාමිවරයා විසිනි.
(5) හැරල්ඩ් ලැස්වෙල් විසිනි.

29. ගුවන්විදුලි මාධ්‍යයේ ලක්ෂණ අතර වඩාත් වැදගත් වන්නේ,
A - පුළුල් කලාපයක් ආවරණය කිරීම.
B - සරල ජංගමශීලී මාධ්‍යයක් වීම.
C - සම්භාව්‍ය භාෂාවක් භාවිත කිරීම.
D - පරිකල්පන ශක්තිය ගොඩනැඟීම අතින් ප්‍රබල වීම.
(1) A, B හා C ය. (2) B, C හා D ය.
(3) A, C හා D ය. (4) A, B හා D ය.
(5) A, B, C, D යන සියල්ල

30. ''තොරතුරු ජාලා එකිනෙකට සම්බන්ධ කිරීම ජාලගත කරණයයි.'' එයට අදාළ නොවන ප්‍රකාශය වන්නේ,
A - LAN
B - WAN
C - UHF
D - WWW
(1) C ය. (2) A ය. (3) B ය.
(4) D ය. (5) A, B, C, D යන සියල්ල

31. නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය කුසලතා අතර වඩාත් වැදගත් වන්නේ,
(1) අවසරයකින් තොරව පරිශීලකයින්ගේ ගිණුම්වලට ඇතුළු වීම.
(2) ඡායාරූපයක් ගෙන සංස්කරණය කිරීම හා වෙබ් පිටුවකට එය ඇතුළත් කිරීම.
(3) ව්‍යාජ ගිණුම් සැකසීම.
(4) ගැටලු හා හැඟීම් ප්‍රකාශ කළ හැකි වීම.
(5) විරෝධාකල්ප ප්‍රචලිත කිරීමට යොදාගත හැකි වීම.

32. සංස්කෘතිය යන වචනය ප්‍රථමවරට සංකල්පයක් ලෙස භාවිතයට ගන්නා ලද්දේ,
(1) එඩ්වඩ් ටයිලර් (2) බී මැලිනොවුස්කි
(3) සැමුවෙල් පුෆෙන්ඩොර්ෆ් (4) රැල්ෆ් ලින්ටන්
(5) මැක්ස් වෙබර්

33. සමාජයේ ඓතිහාසික විකාශය තුළ ඇතිවූ විවිධ සංස්කෘතික ස්වරූප පහත දැක්වේ.
A - සාම්ප්‍රදායික සංස්කෘතිය (Traditional Culture)
B - සම්භාව්‍ය සංස්කෘතිය (Classical Culture)
C - ජනප්‍රිය සංස්කෘතිය (Popular Culture)
D - මාධ්‍ය සංස්කෘතිය (Media Culture)
E - ගෝලීය සංස්කෘතිය (Global Culture)
මින් නිවැරදි වන්නේ,
(1) A,B,C,D,E ලෙස සියල්ල (2) A, B හා C පමණි.
(3) B, C හා D පමණි. (4) C, E හා E පමණි.
(5) A, D හා E පමණි.

34. සන්නිවේදන ක්‍රියාවලිය තුළ දක්නට ලැබෙන සම්ප්‍රදායික සන්නිවේදනය පිළිබඳ වඩාත් නිවැරදි වන්නේ,
(1) ශබ්ද සන්නිවේදනය ආරම්භක අවස්ථාවයි. (2) ලිඛිත සන්නිවේදනය දෙවන අවස්ථාවයි.
(3) සන්නිවේදනය මුද්‍රණය හා බැඳී ඇත. (4) ඩිජිටල් සන්නිවේදනය නවතම අවස්ථාවයි.
(5) විද්‍යුත් සන්නිවේදනය ආරම්භක අවස්ථාවයි.

35. මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,
(1) මාධ්‍ය සංස්කෘතිය සම්භාව්‍ය සංස්කෘතියට සමාන්තර ගමනකි.
(2) මාධ්‍ය සංස්කෘතිය ප්‍රේක්ෂකයාට රසාස්වාදය මෙන්ම දැනුම ද ලබා දීම අරමුණු කරයි.
(3) මාධ්‍ය සංස්කෘතිය විසිවන සියවසේ 15 වන දශකයේ සිට ය.
(4) මාධ්‍ය සංස්කෘතිය ජනප්‍රිය සංස්කෘතියේ කොටසක් ලෙස ද සැලකේ.
(5) මාධ්‍ය සංස්කෘතිය තාක්ෂණය හා වාණිජකරණය මත පදනම් වූ සංස්කෘතියකි.

36. වර්තමානයේ ලෝකය පුරා ව්‍යාප්ත වෙමින් පවතින සංස්කෘතියක් ලෙස බටහිර සංස්කෘතිය ප්‍රමුඛ වී ඇති සංස්කෘතිය හඳුන්වන්නේ,
(1) මාධ්‍ය සංස්කෘතිය (2) ගෝලීය සංස්කෘතිය
(3) සාම්ප්‍රදායික සංස්කෘතිය (4) ජනප්‍රිය සංස්කෘතිය
(5) උප සංස්කෘතිය

37. මිනිසාගේ දෛනික ජීවිතයේ සෑම අංශයකටම බලපාන ලෙස ව්‍යාප්ත වී ඇති ජනමාධ්‍ය හා නව මාධ්‍ය ඔස්සේ නිර්මාණය වන සංස්කෘතිය හඳුන්වන්නේ,
(1) ජනප්‍රිය සංස්කෘතිය යි. (2) මාධ්‍ය සංස්කෘතිය යි.
(3) සන්නිවේදන සංස්කෘතිය යි. (4) ඩිජිටල් සංස්කෘතිය යි.
(5) තාක්ෂණික සංස්කෘතිය යි.

38. ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද,
(1) බහුජන රුචිය අනුව නිර්මාණය වීම.
(2) වාණිජ අරමුණු සහිත වීම.
(3) තාවකාලික ස්වභාවයක් ගැනීම.
(4) සම්භාව්‍ය කලාව මත පදනම් වීම.
(5) පහසුවෙන් ග්‍රහණය කරගත හැකි වීම.

39. මාධ්‍ය සංස්කෘතිය සමාජයට බලපාන ආකාර කිහිපයක් පහත දැක්වේ.
A - ජන සංස්කෘතිය පෝෂණය කිරීම
B - සාම්ප්‍රදායික සංස්කෘතිය විනාශ කිරීම
C - නව සංස්කෘතික රටා බිහි කිරීම
D - විවිධ සංස්කෘතීන් එක්කිරීම
(1) A, B, D පමණි. (2) B, C හා D පමණි. (3) සියල්ල නිවැරදි ය.
(4) A, B, C පමණි. (5) A, C හා D පමණි.

40. "මාධ්‍ය ලෝකය ගෝලීය ගම්මානයක් බවට පත් කර ඇති අතර එය සංස්කෘතීන් අතර හුවමාරුව වේගවත් කර ඇත." මෙම ප්‍රකාශය මගින් පැහැදිලි කරන්නේ,
(1) මාධ්‍යයේ බලපෑම ය. (2) ගෝලීයකරණය යි.
(3) සංස්කෘතික ආධිපත්‍යය යි. (4) සංස්කෘතික සමීකරණය යි.
(5) සංස්කෘතික බහුත්වවාදය යි.

41. මාධ්‍ය සාක්ෂරතාවයේ ස්වකේන්ද්‍රය/ ස්වපථය පිළිබඳ ව සිසුන් තිදෙනෙක් දක්වා ඇති අදහස් කීපයක් පහත දැක්වේ.

A - පුද්ගලයෙකුගේ ස්වකේන්ද්‍රය සැදෙන්නේ තමන් ගොඩනගා ගත් ඉලක්ක ඇසුරිනි.

B - සවිඥානිකව හා අවිඥානිකව ක්‍රියාත්මක වන්නකි.

C - ස්වකේන්ද්‍රය ප්‍රබල වූ විට ග්‍රාහකයා පාලනය කිරීමට ජනමාධ්‍ය තුළ පවතින බලය හීන වේ.

මේ අතරින් සත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A හා C පමණි.
(4) A, B, C යන තිදෙනාම (5) ඉහත කිසිවෙකු නොවේ.

42. වර්තමානයේ වඩා සක්‍රීය තොරතුරු සම්පාදන කාර්යය සිදු කිරීමට මූලික වන්නේ,

(1) පුවත්පත් මාධ්‍යය යි. (2) රූපවාහිනී මාධ්‍යය යි.
(3) ගුවන්විදුලි මාධ්‍යය යි. (4) අවිධිමත් සන්නිවේදන මාධ්‍යය යි.
(5) සමාජ මාධ්‍යය යි.

43. වර්තමාන ජන මාධ්‍යයක ප්‍රධාන හා මූලික අරමුණ වන්නේ,

(1) සියලු සිදුවීම් ග්‍රාහකයා වෙත වාර්තා කිරීම.
(2) පාලන පන්තියේ දෘෂ්ටිවාදය ප්‍රකාශ කිරීම.
(3) සමාජ අවශ්‍යතා විෂය මූලික තොරතුරු මගින් සංතෘප්ත කිරීම යි.
(4) කාලීන ප්‍රශ්න නිරාකරණයට ග්‍රාහකයා සන්නද්ධ කිරීම.
(5) ආරක්ෂක තොරතුරු සියල්ල හෙළිදරව් කිරීම.

44. වර්තමානයේ අන්තවාදී ආගමික සංවිධාන බලගතු වේ. ඒවා මර්ධනය කිරීමට යොදාගත හැකි ප්‍රශස්ත එළඹුම වන්නේ,

(1) නීතිය ක්‍රියාත්මක කිරීම යි. (2) සහයෝගී ව ක්‍රියා කිරීම යි.
(3) හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම යි. (4) සම්මුතික ඒකඟතාව යි.
(5) මාධ්‍ය වාරණය කිරීම යි.

45. නූතන ජනමාධ්‍යවල අවම වශයෙන් දක්නට ලැබෙන ලක්ෂණය වන්නේ,

(1) ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම යි. (2) කලාත්මක නිර්මාණ බිහිකිරීම යි.
(3) වැඩි පෙළඹවීමකින් යුක්ත වීම යි. (4) ග්‍රාහක උත්තේජනය ප්‍රයෝජනයට ගැනීමයි.
(5) පාරිභෝගික සංස්කෘතියක් නිර්මාණය කිරීම යි.

46. ස්ත්‍රී විචාර වාදය සම්බන්ධ නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ස්ත්‍රීවාද දෘෂ්ටි කෝණයෙන් මානව අයිතිය පිළිබඳ සාකච්ඡා ඇත.
(2) ස්ත්‍රීවාදය තුළින් මාධ්‍ය හරහා කාන්තාවන්ට එරෙහිව සිදුවන වෙනස්කම් ගැන අවධානය යොමු කිරීම අවම මට්ටමක ඇත.
(3) ස්ත්‍රීවාදය මගින් කාන්තාවන් ස්වභාවිකව මාධ්‍ය තුළ නිරූපණය වන බව පිළිගෙන ඇත.
(4) මාධ්‍ය මගින් ස්ත්‍රී ගැටලු සාධනීයව විග්‍රහ කරන බව ස්ත්‍රීවාදය මගින් පිළිගෙන ඇත.
(5) ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳව ලිංගිකත්ව සමානාත්මතා පදනමක සිට විචාරය කිරීමයි.

47. මාධ්‍ය සාක්ෂරතාවයේ තෙවැදෑරුම් සිද්ධාන්ත අන්තර්ගත වරණය වන්නේ,

(1) සංජානනය, සන්නිවේදනය හා සාක්ෂරතාවය (2) ස්වසංකල්පය, සහවේදනය හා සමාජානුයෝජනය යි.
(3) ස්වකේන්ද්‍රය, ඥානව්‍යුහය, හා කුසලතා යි. (4) විඥාපනය, නියෝජනය හා නියාමනය යි.
(5) ඥාන ව්‍යුහය, ඥාන පථය, හා ස්වකේන්ද්‍රය යි.

48. චිත්‍රාගාරයකින් පරිබාහිරව රූගත කළ ප්‍රථම දේශීය සිනමා නිර්මාණය වන්නේ,

(1) රේඛාව (2) කඩවුණු පොරොන්දුව (3) ගම්පෙරළිය
(4) රන්මුතු දූව (5) කුරුළුබෑද්ද

49. සන්නිවේදනය ස්වභාවික ක්‍රියාවලියකි. එහි පොදු ගති ලක්ෂණ අතරට ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) ක්‍රියාපටිපාටිය යි. (2) සංකේතාත්මක ය. (3) සන්දර්භයානුගත ය.
(4) සුපරීක්ෂණය යි. (5) විවිධාකාරය.

50. සති අන්තයේ පළවන රාජ්‍ය මාධ්‍ය පුවත්පතක් වන්නේ,

(1) අරුණ, දේශය, දිවයින, විජය, මිහිර
(2) දිවයින, ලංකාදීප, රාවය, මිහිර
(3) ලංකාදීප, අරුණ, දේශය, දිවයින, සිළුමිණ
(4) රාවය, යුක්තිය, දේශය, දිවයින, අද
(5) අරුණ, ලංකාදීපය, ලක්මිණි පහන, දිවයින, විජය

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 1 2 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II**
**Communication & Media Studies - II**

29 S II

පැය 03යි
Three hours

විභාග අංකය : ...................................................................

***සැලකිය යුතුයි.***

- **ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 20කි.**

(01) සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස හැදෑරීම හා අධ්‍යයනය කිරීමෙන් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය අධ්‍යයනයට අවශ්‍ය පදනම සැපයේ.

(i) සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍ර ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් නම් කරන්න.

(ii) සන්නිවේදන විෂය ප්‍රචලිත කිරීම සඳහා විල්බර් ශ්‍රාම් දැක්වූ දායකත්වය උදාහරණ දෙකක් මගින් දක්වන්න.

(iii) දෙවන ලෝක යුධ සමයේ භාවිත කළ සන්නිවේදන ක්‍රම හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ශ්‍රී ලංකාවේ සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ ඇතිවී තිබෙන සංවර්ධනය හා එය ඉගෙනීමේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් විස්තර කරන්න.

(02) මානව ජීවිතය ඵලදායී ලෙස හසුරුවා ගැනීමට සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ.

(i) අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) රූපණය යනු කුමක්දැයි හඳුන්වා එහි දක්නට ලැබෙන විශේෂතා දෙකක් උදාහරණ සහිතව ලියන්න.

(iii) අන්ථ්‍ය සන්නිවේදනයේ ප්‍රයෝජන තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ජනමාධ්‍යයක ක්‍රියාකාරිත්වය HUB ආකෘතිය ඇසුරින් පැහැදිලි කරන්න.

(03) ජනමාධ්‍ය ක්‍රියාවලිය සංවර්ධනය වීමේ දී සාම්ප්‍රදායික මාධ්‍ය ජනමාධ්‍ය හා නව මාධ්‍ය අධ්‍යයනය කිරීම වැදගත් ය.

(i) ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට අනුව ජනමාධ්‍ය නිර්වචනය කරන්න.

(ii) ගුවන්විදුලි මාධ්‍යයේ මූලික ලක්ෂණ හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) සාම්ප්‍රදායික මාධ්‍යයක් ලෙස ජනකවිය ක්‍රියාත්මක වන ආකාරය ජනකවි වර්ග හතරක් ඇසුරින් විස්තර කරන්න.

(04) සමාජ මාධ්‍ය යනු නව මාධ්‍යවල දියුණු අවස්ථාවයි. එසේම එය නව මාධ්‍ය වලින්ම පැන නැඟුණකි.

(i) සමාජ මාධ්‍ය ප්‍රභේද හතරක් නම් කරන්න.

(ii) නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය හැකියා හතරක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ඔබ පාසලේ මාධ්‍ය සමාජය සඳහා බ්ලොග් අඩවියක් නිර්මාණය කිරීමේ පියවර පැහැදිලි කර එහි වැදගත්කම විස්තර කරන්න.

(iv) රූපවාහිනී මාධ්‍යයේ පවතින මූලික ලක්ෂණ හතරක් පදනම් කරගෙන එය පුද්ගල සමාජානුයෝජනයට වැදගත් වන ආකාරය විස්තර කරන්න.

(05) සංස්කෘතිය හා මාධ්‍ය අතර අවියෝජනීය සම්බන්ධතාවයක් පවතී. මාධ්‍යයේ ප්‍රබල සාධකයක් ලෙස සංස්කෘතිය ක්‍රියාත්මක වේ.

(i) සංස්කෘතිය පිළිබඳ එඩ්වඩ් ටයිලර්ගේ නිර්වචනයේ අන්තර්ගත අංග හතරක් නම් කරන්න.

(ii) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ හතරක් නම් කර ඉන් දෙකක් සඳහා උදාහරණ සපයන්න.

(iii) සම්භාව්‍ය සංස්කෘතිය ගොඩනැගීමට දායක වූ වෘත්තික කණ්ඩායම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) සන්නිවේදන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවක් ලෙස අන්තර් සංස්කෘතික අධ්‍යයනයේ වැදගත්කම උදාහරණ හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.

(06) ජනමාධ්‍ය වර්ධනය වීම හා ඊට අදාළ සංස්කෘතියක් ගොඩනැගීම ගෝලීයකරණය මත සිදුවේ. මාධ්‍ය ක්‍රියාවලිය අවබෝධ කරගැනීමට මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වේ.

(i) ගෝලීයකරණයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) මාධ්‍ය සාක්ෂරතාවයට අයත් ප්‍රධාන අංග හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) කෙටි සටහන් ලියන්න.

(1) ස්වකේන්ද්‍රය

(2) ඥාණව්‍යුහය

(3) කුසලතා

(iv) මාධ්‍ය විචාරයේ සමාජීය අවශ්‍යතාව කරුණු හතරක් මඟින් පැහැදිලි කරන්න.

(07) (i) ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතා හතරක් නම් කරන්න.

(ii) ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතියේ දැකිය හැකි විශේෂතා හතරක් නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කම් තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න.

(iv) සිනමාව රූපවාහිනී මාධ්‍යයෙන් වෙනස්වන ආකාර හතරක් විස්තර කරන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 1 2 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය
## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. (1) | 11. (2) | 21. (5) | 31. (2) | 41. (4) |
| 02. (4) | 12. (5) | 22. (2) | 32. (3) | 42. (5) |
| 03. (4) | 13. (3) | 23. (4) | 33. (1) | 43. (3) |
| 04. (5) | 14. (2) | 24. (5) | 34. (5) | 44. (4) |
| 05. (1) | 15. (1) | 25. (3) | 35. (3) | 45. (2) |
| 06. (3) | 16. (5) | 26. (5) | 36. (1) | 46. (5) |
| 07. (4) | 17. (2) | 27. (3) | 37. (2) | 47. (3) |
| 08. (2) | 18. (4) | 28. (4) | 38. (1) | 48. (1) |
| 09. (1) | 19. (5) | 29. (4) | 39. (5) | 49. (4) |
| 10. (4) | 20. (1) | 30. (1) | 40. (2) | 50. (3) |

## II කොටස

(01) (i)
- විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතාව
- සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය
- ගවේෂණශීලීභාවය විචාරශීලී චින්තනය දියුණු වීම.
- මාධ්‍ය සාක්ෂරතාව ඇතිකරගැනීම.
- යහපත් ආචාරශීලී හා ඵලදායී මානව අන්තර් සම්බන්ධතා වර්ධනය
- සමාජ ප්‍රගමනය සඳහා සක්‍රීය දායකත්වය
- නිර්මාණාත්මක චින්තනය හා මාධ්‍ය සන්දේශ නිර්මාණය

(ලකුණු 1/2 × 4 = 2)

(ii)
- ජනමාධ්‍ය පාසල් ආරම්භ කිරීම.
- සන්නිවේදන පර්යේෂණ ආයතන ස්ථාපිත කිරීම.
- විශ්වවිද්‍යාලවල නව අධ්‍යයන අංශ ආරම්භ කිරීම.
- රූපවාහිනී මාධ්‍ය දරුවන්ට බලපාන ආකාරය පිළිබඳ පර්යේෂණ කිරීම.
- මාධ්‍ය මඟින් සමාජය වෙත සිදුකරන බලපෑම අධ්‍යයනය කිරීම.

(ලකුණු 2 × 2 = 4)

(iii)
- පරවියන් යොදාගැනීම.
- වර්ණ භාවිතය
- දුම භාවිතය
- විවිධ කොඩි වර්ග භාවිතය
- ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය
- පුවත්පත් භාවිතය
- දුරකථන භාවිතය
- ගුවන්විදුලිය භාවිතය

(ලකුණු 1/2 × 4 = 2)

(2 × 2 = 4)

(iv)
- දෙහිවල කණිෂ්ට විද්‍යාලය පුවත්පත් කලාවේදය නම් පාඨමාලාව ආරම්භ කිරීම.
- 71 කැරැල්ලෙන් පසු වෘත්තියාභිමුඛ පාඨමාලා ආරම්භ කිරීම.
- 1973 කැලණිය විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශයේ ආරම්භ කිරීම.
- අභ්‍යන්තර හා බාහිර කථිකාචාර්යවරුන්ගේ දායකත්වය
- 1972 වර්ෂයේ දී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ "පුවත්පත් කලාව" නම් පාඨමාලාව ආරම්භ කිරීම.
- 60 දශකයේ දී ලංකා ගුවන්විදුලි සේවය හා ලේක්හවුස් ආයතනය මඟින් වෘත්තීය මාධ්‍යවේදීන් පුහුණු කිරීම.

(ලකුණු 2 × 4 = 8)

(02) (i)
- මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත නොහැකි වීම.
- කිසිදු නිල ස්වභාවයක් දැකිය නොහැකි වීම.
- වේගයෙන් ව්‍යාප්ත වීම.
- ජනතාවගේ කුතුහලය මත ගොඩනැගීම.
- සමාජ මාධ්‍ය ඔස්සේ වඩාත් ප්‍රබලව ක්‍රියාත්මක වීම.
- ප්‍රතිචාර ප්‍රතිපෝෂණයට අවස්ථාවක් නොමැති වීම.
- නිශ්චිත ධූරාවලියක් දැකිය හැකි නොවීම.
- අවිධිමත් ධාරා ඔස්සේ ක්‍රියාත්මක වේ.

(ලකුණු 1/2 × 4 = 2)

(ii)
- මවා පෙන්වීමක් ලෙස යම් රංගනයක යෙදීම හෝ දැක්වීම/ යම් යම් අර්ථ සන්නිවේදනය
- ප්‍රාථමික මානවයාගේ සිට රංගනය මඟින් ප්‍රාථමික සන්නිවේදනයක් සිදුකිරීම.
- අභිනය මඟින් රූපණයේ නිරත වීම.
- විවිධ අවස්ථා අනුව රූපණය සිදු කිරීම. (ගුරු භූමිකාව, කථිකයෙකුගේ භූමිකාව)

(හැඳින්වීම 1 × 2 = 2
පැහැදිලි කිරීම 2 × 1 = 2)

(iii)
- අධ්‍යාපන කාර්ය සඳහා
- සහසම්බන්ධතා ගොඩනැංවීමට
- ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂමව සිදුකර ගැනීමට
- ප්‍රචාරණ කටයුතු සඳහා
- නිර්මාණාත්මක කාර්ය්‍ය සඳහා

(ලකුණු 2 × 3 = 6)

(iv)
- HUB ආකෘතිය ඇඳ එහි අංග අට දක්වා පැහැදිලි කිරීම ප්‍රමාණවත් වේ.

(ලකුණු 2 × 2 = 4)

(03) (i) ''අදෘශ්‍යමානව සිටින පිරිසකට කිසියම් මාධ්‍යයකින් අමතන්නේ නම් එය ජනමාධ්‍ය වේ.''

(ලකුණු 02)

(ii)
- ක්ෂණික වීම.
- පුළුල් කලාපයක් ආවරණය කරයි.
- එක් දිශාවකට සංදේශ ගමන් කරයි.
- සරල ජංගමශීලී මාධ්‍යයකි.
- එක් වරක දී තේරුම් ගත හැකි ලෙස සංදේශ ඉදිරිපත් කළ යුතුය.
- පරිකල්පන ශක්තිය ගොඩනැගීම අතින් ප්‍රබලය.

(නම් කිරීම 1/2 × 2 = 1
පැහැදිලි කිරීම 1 × 2 = 2)

(iii)
- ගොයම් කවි, පතල් කවි, බඹර කවි, පැල් කවි ආදී ජනකවි වර්ග හතරක් උදාහරණ ලෙස දැක්විය යුතුය.

(ලකුණු 2 × 4 = 8)

(04) (i) Facebook, Twitter, Linkedin, pinterest, Instagram, Skype, Viber

(ලකුණු 2 × 4 = 8)

(ii)
- රූපයක් බාගත කරන්නේ කෙසේ ද?
- පෙළට සබැඳියක් එකතු කරන්නේ කෙසේ ද?
- ඡායාරූපයක් ගෙන සංස්කරණය කිරීම සහ වෙබ් පිටුවක ඇතුළත් කරන්නේ කෙසේ ද?
- වෙබ් පිටුවක වීඩියෝවක් සඳහා කේතයක් ඇතුළු කර ප්‍රතිනිර්මාණය කරන්නේ කෙසේ ද?

(නම් කිරීම ලකුණු 1/2 × 4 = 2
විස්තර කිරීම ලකුණු = 2)

(iii) G-mail ගිණුමක් අවශ්‍ය වීම, බ්ලොග් අඩවි නිර්මාණය කිරීමේ අඩවියකට පිවිසීම, මෙනුව තෝරාගැනීම, බ්ලොග් අඩවි ලිපිනයක්, මුහුණත පෙනුමක් නිර්මාණය කිරීම.
- විද්‍යුත් සඟරාවක් ලෙස ක්‍රියාත්මක කළ හැකි වීම.
- නව මතවාදයන් හා දැනුම් හුවමාරු කරගත හැකි වීම.
- බොහෝ පිරිසකගේ සිට බොහෝ පිරිසක් දක්වා සන්නිවේදනය කළ හැකි වීම.
- නිර්මාණාත්මකව සන්නිවේදන කිරීම.

(පියවර දැක්වීම ලකුණු = 3)
වැදගත්කම 1 × 3 = 3)

(iv)
- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වීම.
- විවිධාකාර අන්තර්ගතයන්ගෙන් සහ විචිත්‍රවත් ආකෘතිවලින් සමන්විත වීම.
- පෞද්ගලික ගෘහස්ථ සම්පතාවයකින් යුක්ත වීම.
- ආකර්ශනීය මාධ්‍යයක් වීම.
- පුද්ගලයන්ගේ පූර්ණ අවධානය ග්‍රහණය කරගන්නා මාධ්‍යයක් වීම.
- සංකීර්ණ තාක්ෂණයක් සහිත මාධ්‍යයක් වීම.
- ජාතික හා ජාත්‍යන්තර ලක්ෂණයන්ගෙන් යුක්ත වීම.
- විධිමත් ආයතනගත සංවිධාන ව්‍යුහයකින් සමන්විත වීම.

**සමාජානුයෝජනය වැදගත් වන ආකාරය :**
- අනුකරණය
- අදහස්, දැනුම, නව චර්යා මතවාද, ගොඩනැගීම.

(ලකුණු 1/2 × 4 = 2)

(05) (i) දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාරය, සිරිත්විරිත්

(ලකුණු 1/2 × 4 = 2)

(ii)
- මාධ්‍ය සංස්කෘතිය තාක්ෂණය සමඟ ප්‍රබල සම්බන්ධතාවයක් පැවතීම.
- නව සමාජ රටාවන් ගොඩනැංවීමට හේතු වේ.
- ගතිකත්වයෙන් යුක්ත වීම.
- සමාජය තුළ කෘතිම අවශ්‍යතා නිර්මාණය කිරීම.
- ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම.

- ගෝලීයකරණය සමඟ සමීප සම්බන්ධතාවයක් පැවතීම.
- ව්‍යාපාරික ආධිපත්‍යයක් පැවතීම.

(නම් කිරීම ලකුණු 1/2 × 4 = 2
පැහැදිලි කිරීම ලකුණු 1 × 2 = 2)

(iii) ලේඛකයන්, කලාකරුවන්, සංගීතඥයින්, නර්තනවේදීන්, චින්තකයින්....
මෙම පුද්ගලයින්ගේ විශේෂ බුද්ධිමය හා කලාත්මක හැකියාව සම්භාව්‍ය සංස්කෘතිය ගොඩනැගීමට ඉවහල් වූ ආකාරය විස්තර කළ යුතුයි.

(ලකුණු 2 × 3 = 6)

(iv)
- දෙවන ලෝක යුද්ධයෙන් පසුව විවිධ ජාතිකයන්ට සිදුවූ බලපෑම
- විවිධ සමාජවල සහජීවනය ගොඩනැගීම.
- මිනිසා අවට ලෝකයට අනුවර්තනය කරගන්න ප්‍රධාන උපකරණයක් ලෙස යොදාගැනීම.
- අන්‍යෝන්‍යතාව වර්ධනය කිරීම.
- පුද්ගලයාට මානව චර්යාවන්, ජනශ්‍රැතිකාංග වෙනත් සංස්කෘතීන් සමඟ සංසන්දනය කිරීම.
- විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමට

(ලකුණු 2 × 4 = 8)

(06) (i)
- ගතික ක්‍රියාවලියක් වීම.
- ජාතික රාජ්‍යයන් අභියෝගයට ලක්වීම.
- නව සංස්කෘතික රටාවන් මිශ්‍ර වීම.
- මාධ්‍ය තාක්‍ෂණය භාවිත වීම.
- අන්තර්ජාතික න්‍යාය පත්‍රයකට අනුව රටවල් හැසිරවීම.
- භූගෝලීය සීමා ඉක්මවා මානව සබඳතා වර්ධනය වීම.
- පාරජාතික ආයතන හා සංවිධාන බිහිකිරීම.

(ලකුණු 1/2 × 4 = 2)

(ii)
- මාධ්‍යයන්ට ප්‍රවේශවීම.
- මාධ්‍ය විශ්ලේෂණය කිරීම.
- මාධ්‍යයන් ඇගයීම.
- මාධ්‍ය නිර්මාණය සහ මාධ්‍යයක් තුළ ක්‍රියාශීලීව කටයුතු කිරීමේ සමත් බව
- මාධ්‍ය පරිහරණය කිරීම.

නම් කිරීමට 1/2 × 4 = 2
පැහැදිලි කිරීමට 1 × 2 = <u>2</u>
<u>4</u>

(iii)
- **සංකේන්ද්‍රය** සකස් වී ඇත්තේ තමන් ගමන් කරව තම ඉලක්ක ඇසුරිනි. එය විඥානිකව හා අවිඥානිකව සිදුවේ.
- ඥාන ව්‍යුහය යනු පුද්ගල මනසක තැන්පත් වී ඇති සැකසුන තොරතුරු කට්ටලයකි.
- කුසලතා යනු යම් ක්‍රියාවක නිතර යෙදී ඒ පිළිබඳ පළපුරුද්දක් ලබා ගැනීමයි. මාධ්‍ය කුසලතා වශයෙන් මාධ්‍ය විශ්ලේෂණය තක්සේරුකරණය, කාණ්ඩවලට බෙදා ගැනීම ආදිය සිදුකළ හැකිය.

(ලකුණු 2 × 3 = 6)

(iv)
- මාධ්‍ය ග්‍රහණය කරගන්නා සාමාන්‍ය ජනයාට එය විනිවිදව දැකීමට ඇති හැකියාව අවම නිසා විචාරක සහාය අවශ්‍ය වීම.
- සංජානනය ඉහළ මට්ටමක පවත්වාගැනීමට
- නිර්මාණකරුවන්ට තම නිර්මාණ පුළුල් ලෙස විමර්ශනය කිරීමට හැකිවීම.
- ග්‍රාහක ශක්තිය ඉහළ නැංවීම නිසා ග්‍රාහකයන් හා මාධ්‍ය අතර ගනුදෙනුව ඉහළ මට්ටමකට පත්වීම.
- නව නිර්මාණ බිහිකිරීම සඳහා තම චින්තනය මෙහෙයවීමට මඟපෙන්වීම.

(ලකුණු 2 × 4 = 8)

(07) (i)
- මැනවින් සවන්දීම.
- විවිධ හඬවල් වෙන්කර හඳුනාගැනීම.
- ශ්‍රව්‍ය සන්නිවේදන අවස්ථා අධ්‍යයනය කිරීම.
- විවිධ ශබ්ද භාවිතයෙන් නිර්මාණය කිරීම.

(ලකුණු 1/2 × 4 = 2)

(ii)
- චක්‍රීය සන්නිවේදන ආකෘතියකි.
- සන්නිවේදන ග්‍රාහක භූමිකා හුවමාරුව
- ආකේතකරණය, විකේතකරණය සහ අර්ථකථනය යන අවස්ථා විස්තර කිරීම.
- සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව දැක්වීම.
- ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය විස්තර කිරීම.

නම් කිරීම 1/2 × 4 = 2
විස්තර කිරීම 1 × 2 = <u>2</u>
<u>4</u>

(iii)
- දැනුම් ඉගෙනුම් සම්පාදනය
- උපදේශාත්මක සංදේශ ජනනය කළ හැකි වීම.
- සංස්කෘතිකාංග හුවමාරු කිරීමට හැකි වීම.
- භාව ප්‍රකාශනය උසස් මට්ටමක පැවතීම.
- අහිතකර සමාජ ප්‍රවණතා විවේචනය කිරීම.
- විනෝදාස්වාදය සඳහා ද යොදාගත හැකිවීම.

(ලකුණු 2 × 3 = 6)

(iv)

| චිත්‍රපටය | රූපවාහිනිය |
|---|---|
| - ග්‍රාහකයා සීමා සහිත වීම | - ග්‍රාහක පිරිස සීමා රහිත වීම. |
| - රසායනික මාධ්‍යයකි. | - විද්‍යුත් මාධ්‍යයකි. |
| - සන්දේශවල කාලය සීමා සහිතය. | - සංදේශවල කාලය සීමා රහිතය. |
| - සන්නිවේදන බාධාවලින් තොරව නැරඹිය හැකිය. | - සන්නිවේදන බාධා ඇති ඇති වේ. |
| - අඳුර සමඟ මුසුවූ මාධ්‍යයකි. | - ආලෝකය සමඟ මුසුවූ මාධ්‍යයකි. |

(ලකුණු 2 × 4 = 8)